ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/27/01/23

# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කැඳවන ලද සාකච්ඡාවකදී මෙවර අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වෙන 2023 වර්ෂයේ ජනවාරි මස 23 වන දින සිට පෙබරවාරි මස 17 දින දක්වා කාල සීමාව තුළ අඛණ්ඩව විදුලි බල සැපයුම ලබාදීම සඳහා කටයුතු කිරිම සඳහා 2023 ජනවාරි මස 25 වන දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, විදුලිබල මණ්ඩලය සහ ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සමථයකට එළඹුණි.

ඒ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත ප්‍රකාරව, මෙම සමථය විධානයක් ලෙස 2023.01.26 වන දින නිකුත් කරන ලදී. ඒ අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, විදුලිබල මණ්ඩලය සහ ඛණිජ තෙල් නීතිගත සංස්ථාව යන පාර්ශවයන්ට 2023.01.26 වන දින පස්වරු 4.00 ට පෙර ඒ අනුව ක්‍රියාකර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය බව දන්වන ලදි.

මෙම විධානය ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රතිචාර දැක්වීම පැහැර හැරීම පදනම් කර ගෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත ප්‍රකාරව “කොමිෂන් සභා අධිකාරියට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදට” සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අද දින නඩු පැවරීමට අදාල සහතික යොමු කරන ලදි. එහිදී එම්.පී.ඩී.යූ.කේ.මාපා පතිරණ ලේකම්, විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය, එම්.එස්.ඉලගකෝන් සභාපති ලංකා විදුලිබල මණ්ඩලය සහ නිතිපති වරයා මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවන් ලෙස සඳහන් කරන ලදි.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.01.27